# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත
## மாகாண அரசாங்க சேவை ஆணைக்குழு தென் மாகாணம்
## PROVINCIAL PUBLIC SERVICE COMMISSION, SOUTHERN PROVINCE

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංකීර්ණය,6 වන මහල,කළුවැල්ල, ගාල්ල. / மாவட்டச் செயலாளர் ஒன்றியம்,6ம் மாடி, கழுவெல்ல, காலி. / District Secretariat,6th Floor, Kaluwella, Galle.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No : SP/PSC/05/01/30 | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2024.09. 18 |

ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, මධ්‍යම රජයේ චක්‍රලේඛ දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීම - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 22/2021**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබේ අංක. CSS/03/13/CIR.COM හා 2024.08.09 දිනැති ලිපිය හා බැඳේ.

02. එහි සඳහන් පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 2021.11.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 22/2021 එය බලාත්මක කල දින සිට දකුණු පළාත් සභාවට අදාල කර ගැනීම 2024.09.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක. G/SP/1/1/2/2024 හා 2024.09.11 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වමි. අනුමැතිය සහිත එම චක්‍රලේඛයේ පිටපතක් ද මේ සමඟ අමුණා එවමි.

ගාමිණී වීරවික්‍රම
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ගාමිණී වීරවික්‍රම**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**දකුණු පළාත**

දුරකථන / தொலைபேசி / Telephone
සභාපති/தலைவர்/ Chairman : 091-2222497
ලේකම්/செயலாளர்/ Secretary : 091-2233366
සහකාර ලේකම්/உதவி செயலாளர்/Asst.Secretary: 091-2248450
කාර්යාලය/அலுவலகம்/Office : 091-2234309
ෆැක්ස් / பெக்ஸ் / Fax : 091-2228811
ඊ-මේල් / ஈ-மெயில் / e-mail : secretary@psc.spgov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2021

මගේ අංකය : EST 5/6/9/11
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.11.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය**

"රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016" මැයෙන් නිකුත් කළ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හා "රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය" මැයෙන් නිකුත් කළ 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ක්‍රියාත්මක වන දිනට පෙර පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ තනතුරු තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහිලා සැලකීමට 2021.07.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. ඒ අනුව, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 11.3 වගන්තිය හා 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017හි 03 ඡේදය යටතේ ඇති 11.3 වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

> **"11.3 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ යම් තනතුරක් තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහි ලා සලකනු ලබයි."**

03. මෙම සංශෝධනය 2021.07.05 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය